සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය
எனது இல
My No } DDD/HO/07/SD/

ඔබේ අංකය
உமது இல
Your No } .............................

දිනය
திகதி
Date } 2016.09. .............................

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

**<u>සමෘද්ධි /දිවිනැගුම කැකුළු ළමා සමාජ සංස්කෘතිකහා සාහිත්‍ය තරඟාවලිය - 2016</u>**

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමුකළ සමාංක දරණ 2016.03.31 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍යතරඟාවලියේ **සිංහල මාධ්‍ය ජාතික තරඟාවලිය <u>2016 ඔක්තෝබර් මස 16 වනඉරු දිනපෙ.ව. 8.30 ට හා දමිළ මාධ්‍ය ජාතික තරඟාවලිය 2016ඔක්තෝබර් මස 23 වන ඉරු දින පෙ.ව. 8.30 ට මාලඹේ රාහුල බාලිකා විද්‍යාලයේදී</u>**පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

03 සියළු තරඟ ඉසව්වලින් දිස්ත්‍රික් මට්ටමින් ප්‍රථම ස්ථාන ලබා ගත් තරඟකරුවන් පමණක් (ළමා කතන්දර හැර) අදාල දිනවලදී අනිවාර්යෙන් සහභාගි විය යුතුය. මේ සම්බන්ධයෙන් නිකුත්කළ ඉහත ලිපියේ සඳහන් උපදෙස් පරිදි මෙම තරඟාවලිය පවත්වනු ලබන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ. තරඟාවලිය පැවැත්වීමෙන් අනතුරුව ප්‍රතිඵල සති 2 ක් තුළ දිස්ත්‍රික්කය වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

04 තරඟකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ සනාථ කළ පිටපතක් සහ ප්‍රජා මූල බැංකු සංගමයේ ළමා ගිණුමේ පාස් පොත නොවරදාවම ඉදිරිපත් කල යුතුය.

05 ජාතික තරඟාවලියට සහභාගිවීම සඳහා දිස්ත්‍රික් නියෝජනය පහත සඳහන් පරිදි විය යුතුය.

| | | |
|---|---|---|
| දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | - | 01 |
| සමාජ සංවර්ධන විෂය කළමණාකරුඇතුළු කළමණාකරුවන් | - | 02 |
| දිවිනැගුම සංවර්ධන නිළධාරි | - | 01 |
| දිවිනැගුම සමාජ සංවර්ධන නිළධාරි | - | 05 |
| දෙමාපියන් | - | 05 |

තරඟකරුවන් (ඔබ දිස්ත්‍රික්කයට අදාළ ප්‍රතිඵල ලේඛණයට අනුව)

06. ඒ අනුව එක් දිස්ත්‍රික්කයකින් තරඟකරුවන් හැරුණු විට සහභාගි විය යුතු උපරිම සංඛ්‍යාව 14 ක් වේ. තරගය පැවැත්වෙන දින සංග්‍රහ ඇතුළු අනිකුත් කටයුතු සංවිධානය කර ගැනීමේ පහසුව සඳහා ඔබ දිස්ත්‍රික්කයෙන් තරගය සඳහා සහභාගිවන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු 2016.10.05 දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතු වේ.

08. තව ද තරඟයට සහභාගි වන්නන් සඳහා නේවාසික පහසුකම් අවශ්‍ය වන්නේනම් එම වියදම, තරඟකරුවන් ප්‍රවාහනයවෙනුවෙන් ගාස්තු හා අමතරසංග්‍රහ වියදම් දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත ඒ ඒ සමාජ සංවර්ධන පදනම්වලින් වැය දැරීමට කටයුතු කළ හැකිය.

09. තරඟය සම්බන්ධ වැඩිදුර විස්තර ඇමුණුම් අංක 01 හි දැක්වෙන අතර තරඟකරුවන් 3000 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගි වන වන මෙම තරඟාවලිය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ හා කාර්ය මණ්ඩලයේ සහයෝගය උදෙක්ම අපේක්ෂා කරමි.

චන්ද්‍රා වික්‍රමසිංහ

අධ්‍යක්ෂ ජනරාල්